**ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව**

**------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

තැපැල් දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ ඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක්වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකි විය.

(ආ) තැපැල් දෙපාර්තමේන්තුව විසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ආදායම් ලෙස දැක්විය යුතු රු.2,939,341,090 වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ රු.2,294,597,076 ක් දැක්වීමෙන් එම අගය රු.644,744,014 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වෙනත් ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ප්‍රකාශනවල සටහන් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය නිවැරදි වුවත්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට අදාලවන අදාල ආකෘතියෙහි වෙනම දැක්වීමට ඉඩ ප්‍රස්ථා නොමැති විෂයයන් ගණනාවකම අදාල ගැලපීම් සිදු කිරීමෙන් පසු අගය වන රු.2,294,597,076 ක වටිනාකම ගිණුමෙන් නිරූපනය කර ඇති බව. |
| (ආ) | රජයේ සේවක අර්ථසාධක අරමුදල් ලැබීම් (PSPF) රු.11,200,568 ක් ආදයම් ලැබීම් යටතේ සහ අරමුදල් ගෙවීම් රු.4,382,021 ක් ප්‍රධාන ලෙජර් වියදම් යටතේ දක්වා නොතිබුණි. | නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු වීම. | රජයේ සේවක අර්ථ සාධක අරමුදල් සටහන් කිරීමට අදාල ආකෘතියෙහි ඉඩ ප්‍රස්ථාව නොමැති නිසා රජයේ සේවක අර්ථ සාධක අරමුදල් (PSPF) හි ලැබීම් රු.11,200,568 ක් හා අරමුදල් ගෙවීම් රු.4,382,021 ක් වටිනාකම් වෙනත් ආදායම් නොවන ලැබීම් යටතේ වෙනත් ලැබීම් වටිනාකමට ගැලපීම් කර ඇති බව. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනය සමඟ වූACA2 (ii) වියදම් ප්‍රකාශයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් දරා ඇති වියදම් රු.17,207,449 ක් ලෙස සටහන් කර තිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එම වටිනාකම රු.26,245,264 ක් විය. එහි වෙනස වූ රු.9,037,815 ක ප්‍රමාණය දෙපාර්තමේන්තු මුදල් පොතට අනුව වියදම් ලෙස ගිණුම් ගතකර තිබුණි. | වෙනත් දෙපාර්තමේන්තු මගින් දරන ලද වියදම අදාල තීරුවේ ඇතුළත් කළ යුතුවීම. | මෙම වියදම මෙතෙක් දෙපාර්තමේන්තුව විසින් කරන ලද හර කිරීම් ලෙස සටහන් වියයුතු වුවද, එම වියදම දෙපාර්තමේන්තුව විසින් දරන ලද වියදම් යටතේ ඇතුළත් කර ඇති බව. |
| (ඈ) | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ රු.690,083,977 ක මුදල ප්‍රධාන ලෙජර් වියදම් යටතේ | භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ මුදල ප්‍රධාන ලෙජර් වියදම් | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ ඒසීඒ- එෆ් ආකෘතියෙහි භාණ්ඩාගාරයට ප්‍රේෂණය කල රු.690,083,977 ක මුදල |

| | | |
|---|---|---|
| දක්වා නොතිබුණි. | යටතේ දැක්විය යුතුවීම. | සටහන් කිරීමට තීරුවක් නොමැති නිසා එම වටිනාකම ආදායම් නොවන ලැබීම් යටතේ ඇති වෙනත් ලැබීම් වටිනාකමට ගැලපීම් කර ඇති බව. |

**1.6.2** මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ ලෙස රු.1,290,817,826 ක් දක්වා තිබුණද එම අගයන් දෙපාර්තමේන්තු පොත්වලින් තහවුරු කර ගැනීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් දේපළ පිරියත වටිනාකම් දෙපාර්තමේන්තු පොත්වලින් තහවුරු විය යුතුවීම. | සිගාස් අනුව 2018 දෙසැම්බර් 31 දිනට නැවත ආගණනය කරන ලද වත්කම් වටිනාකම සහ 2018 වර්ෂයේ මිලදී ගන්නා ලද වත්කම් ද ඇතුළත්ව රු.1,290,817,826 ක වටිනාකමක් ඉදිරිපත් කර ඇත. දිසා ගිණුම් කාර්යාල, දිසා තැපැල් අධිකාරී කාර්යාලයන්හි සහ ප්‍රධාන කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණ පවත්වාගෙන යාමට කටයුතු කරන අතර ආගණනය කරන ලද වටිනාකම්වලට අනුව පැරණි ස්ථාවර වත්කම් ලේඛණවල අදාල යාවත්කාලීන කිරීම් සිදු කරන ලෙස දන්වා ඇත. |

**1.6.3** මුදල් ප්‍රවාහ ප්‍රකාශය
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ලෙස රු.මිලියන 170,722.18 ක මුදලක් දැක්විය යුතු වුවද, එය රු.මිලියන 7,929.80 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.මිලියන 162,993.38 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණයේ පෙන්වා දී ඇති අගයන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් ලෙස දැක්විය යුතු වීම. | මෙහෙයුම් ක්‍රියාවලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දී මුදලින් කළ ගණුදෙනු පමණක් සැලකිල්ලට ගෙන සටහන් කර ඇති අතර හරස් සටහන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේදී සැලකිල්ලට නොගැනීම නිසා විගණනයෙන් පෙන්වා දී ඇති අඩු අගයන් නිරූපනය වී ඇති බව. |
| (ආ) මුදල් වැයකිරීම් යටතේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | පෙන්වා දී ඇති පරිදි නිවැරදි අගයන් මූල්‍ය | - එම - |

| | | | |
|---|---|---|---|
| | ලෙස රු.මිලියන 13,327.22 ක් දැක්විය යුතු වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.මිලියන 13,194.25 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.මිලියන 132.96 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුවීම. | |
| (ඇ) | මෙහෙයුම් ක්‍රියාකරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ සහනාධාර හා මාරුකිරීම් ලෙස දැක්විය යුතු අගය වූ රු.120,956,864 වෙනුවට එම අගය රු.40,633,134 ක් ලෙස දැක්වීමෙන් රු.80,323,730 ක් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනිම යටතේ දැක්විය යුතු රු.96,215,373 ක අගය වෙනුවට රු.242,736,583 ක් දැක්වීමෙන් එම අගය රු.146,521,210 ක් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | අදාල ආකෘතියේ ප්‍රාග්ධන වත්කම් ප්‍රතිෂ්ඨාපනය සඳහා වැය කරන ලද වටිනාකම් සටහන් කිරීමට තීරුවක් නොතිබුණි.එබැවින් භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිළදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස සටහන් වී ඇති තීරුවෙහි ප්‍රාග්ධන වත්කම් ප්‍රතිෂ්ඨාපනය සහ ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම යටතේ වියදම් කර ඇති හරස් සටහන් ඉවත් කරන ලද මූල්‍යමය වටිනාකම දැක්වීමට කටයුතු කර ඇති නිසා රු.242,736,583 ක අගයක් සටහන් කර ඇති බව. |
| (ඉ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණු තැන්පත් ගෙවීම්, සේවක අර්ථ සාධක අරමුදල් ගෙවීම් සහ තැපැල් කාර්යාල නියෝජිත ගනුදෙනු ගෙවීම් පිළිවෙලින් රු.215,293,649,රු.4,382,021 සහ රු.156,200,520,949 ක් විය. | මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ නිවැරදි අගයන් දැක්විය යුතු වීම. | විගණනයෙන් පෙන්වා දුන් ආකාරයට මින් ඉදිරියට මෙම වටිනාකම් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ වන ආදායම් නොවන ලැබීම් යටතේ සටහන් කිරීමට කටයුතු කරන බව. |
| (ඊ) | ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ අත්තිකාරම් ලැබීම් රු.772,514,500 ක් සහ අත්තිකාරම් ගෙවීම් | අත්තිකාරම් ලැබීම් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ යටතේ හා අත්තිකාරම් | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමට අදාල අත්තිකාරම් ලැබීම් රු.772,514,500 සහ අත්තිකාරම් ගෙවීම් රු.845,813,729 මුදල් සටහන් කිරීමට පැහැදිලි උපදෙසක් සහ |

| | | | |
|---|---|---|---|
| | රු.845,813,729 ක් දක්වා නොතිබුණි. | ගෙවීම් එම ප්‍රවාහයේ වියදම් යටතේ දැක්විය යුතු වීම. | ආකෘතියෙහි සටහන් කිරීමට තීරුවක් නොමැති වූ නිසා මෙම වටිනාකම් වැය කිරීම් යටතේ දක්වා ඇති තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම් යටතේ සටහන් කර ඇති බව. |
| (උ) | භාණ්ඩාගාරයට පියවන ලද මුළු අග්‍රිම අගය වූ රු.690,083,977 වෙනුවට රු.600,000,000 ක් මුදල් ප්‍රවාහයේ දැක්වීමෙන් එම ශේෂය රු.90,083,977 ක් අඩුවෙන් දක්වා තිබුණි. | භාණ්ඩාගාරයට පියවනු ලැබූ නිවැරදි අගය සටහන් කළ යුතුවීම. | භාණ්ඩාගාරයට පියවන ලද මුළු අග්‍රිමය රු.690,083,977 වටිනාකමෙන් රු.600,000,000 ක මුදල පමණක් පියවන ලද අග්‍රිම යටතේ සටහන් කර ඇති අතර භාණ්ඩාගාරයට පියවන ලද මාර්ගස්ථව පවතින රු.90,083,977 ක වටිනාකම තැන්පත් ගිණුම් හා මුදල් වැය කිරීම් යටතේ ඇති තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම් තීරුව යටතේ වටිනාකමට ඇතුළත්ව සටහන් කර ඇති බව. |
| (ඌ) | 2018 ජනවාරි 01 දිනට අග්‍රිම ගිණුමේ පැවති රු.461,740,639 ක ශේෂය සහ 2018 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ පැවති රු.455,954,301 ක ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අනාවරණය කර නොතිබුණි. | නොපියවූ අග්‍රිම ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කළ යුතුවීම. | අග්‍රිම ගිණුමේ නොපියවූ අග්‍රිමයක් ලෙස පවතින අග්‍රිම ගිණුමේ මුදල් ශේෂය යටතේ සටහන්වීමක් නොවන නිසාත් මුදල් පොතේ ශේෂය ශුන්‍ය වන නිසාත් 2018 ජනවාරි මස 01 වන දිනට පැවති අග්‍රිම ගිණුමේ නොපියවූ ආරම්භක ශේෂය රු.461,740,639 ක ශේෂය සහ 2018 දෙසැම්බර් 31 දිනට නොපියවූ අග්‍රිම ශේෂය රු.455,954,301 ක යන වටිනාකම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය යටතේ සටහන් කිරීමට කටයුතු නොකළ බව. |

### 1.6.4 හිඟ ආදායම

-------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ හිඟ ආදායම් රැස්කිරීම් මූල්‍ය ප්‍රකාශනය අනුව, රු.310,047,173 ක් වුවද හිඟ ආදායම් විස්තර අනුව රු.707,549,824 ක් වූයෙන් වෙනස රු.397,502,651 ක් විය. | හිඟ ආදායම් රැස්කිරීම් නිවැරදි ලෙස හෙළිදරව් කළ යුතුවීම. | 2017 වර්ෂයට පෙර කාලපරිච්ඡේදයට අදාලව රැස්කරන ලද හිඟ ආදායම් මුදල් රු.397,502,651 ක වටිනාකම අතපසුවීමකින් සමාලෝචිත වර්ෂයේ ආදායම් රැස් කිරීමේ වටිනාකමට ඇතුළත් වී ඇත. |

### 1.6.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දිසා ගිණුම් කාර්යාල 15 ක කේවල ණය ශේෂ එකතුව සහ පාලන ගිණුමේ ශේෂය අතර අසමානතා පැවතුණි. එම අසමානතා අතුරින් වෙනසට හේතු සොයා ගැනීමට නොහැකිව තිබූ දිසා ගිණුම් කාර්යාල 05 ක විචලනයෙහි වටිනාකම රු.3,493,191 ක් වූ අතර එම වටිනාකම කේවල ශේෂ වටිනාකමට වඩා පාලන ගිණුමේ ශේෂය වැඩිවූ අවස්ථා විය. | දෙපාර්තමේන්තු පරීක්ෂණ සඳහා දීර්ඝ කාලයක් ගත වී ඇති බැවින් එය නිමකිරීමටත්, වෙනස්කම් සොයා නොගත් ශේෂය නිරවුල් කිරීමටත් කටයුතු කළයුතු වීම. | රු.3,493,191 ක ශේෂයෙන් 2019 මැයි 31දින වන විටරු.410,018 ක් හඳුනාගෙන ඇත. තවද රු.1,295,400 ක් කළුතර දිසා ගණකාධිකාරී කාර්යාලයේ සිදුවී ඇති මූල්‍ය වංචාවක්වේ. ඒ අනුව රු.1,705,418 වටිනාකමක් හඳුනාගෙන ඇත. මූල්‍ය වංචාව සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් අභ්‍යන්තර විමර්ශනයක් සහ කළුතර විශේෂ අපරාධ විමර්ශන අංශය මගින් ද පරීකෂණයක් සිදු කරමින් පවතී. ඉතිරි හඳුනා නොගත් රු.1,787,773 ක වෙනස්කම් සම්බන්ධයෙන් පසුගිය ලේඛණ පරීක්ෂා කරමින් වෙනස නිරවුල් කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අදායම් කළමනාකරණය

පහත සදහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නීරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ඇස්තමේන්තු අගයන් හා තථ්‍ය අගයන් සැසඳීමේදී ආදායම් කාණ්ඩ 12 ක හිතකර විචලතාවය රු.302,251 සිට රු.73,532,190 දක්වා වූ පාරසයක පැවති අතර ප්‍රතිශතයක් ලෙස සියයට 35 සිට සියයට 257 දක්වා වූ පරාසයක විය. ආදායම් කාණ්ඩ 17 ක අහිතකර විචලතාවය රු.2,259 සිට රු.84,092,351 දක්වා වූ පරාසයක පැවතිණි.එය ප්‍රතිශතයක් ලෙස සියයට 25 සිට සියයට 418 දක්වා වූ පරාසයක් අතර ඇස්තමේන්තු කර නොමැති ආදායම් කාණ්ඩ 04 ක් සඳහා ද ආදයම් එකතු කර තිබුණි.ඒ අනුව 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 3 ඡේදය ප්‍රකාරව ආදායම් පුරෝකථනය කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම සිදුකර නොතිබුණි. | 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 3 ප්‍රකාර ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | 2020 වර්ෂයේදී මෙම සියලු කාර්යයන් පිළිබඳ ගැඹුරු අධ්‍යනයකින් පසු ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කරන බව. |

**2.2 වියදම් කළමනාකරණය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එක් පුනරාවර්තන වැය විෂයයක සහ ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක ශුද්ධ ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.21,787,622 ක් ඉතිරිවී තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 73 අතර පාරසයක වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවීම. | සැලසුම් කරන ලද භාෂා ප්‍රවීනතාවය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම, 2018 වර්ෂයේ පූජාපිටිය තැපැල් කාර්යාලය ඉදිකිරීම අවසන් කිරීමට නොහැකි වීම හා මුද්දර ඇල්බම් සඳහා වූ ප්‍රසම්පාදනයේදී මිල ගණන් ඉදිරිපත් නොවීම වැනි හේතු නිසා සියයට 5කට වඩා වැඩි ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මු.රෙ. 94 ප්‍රකාර ප්‍රතිපාදන නොතිබියදී බැරකම්වලට බැඳිය නොහැකි වුවත් සමාලෝචිත වර්ෂයේදී වැය විෂයයන් 10 ක් සඳහා ප්‍රතිපාදන ඉක්මවා රු.මිලියන 173.56 ක් සඳහා බැරකම්වලට බැඳී තිබුණි. | මු.රෙ.94 විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. | විශේෂයෙන් ජාත්‍යන්තර තැපැල් ගනුදෙනුවලදී සහ දේශීය තැපැල් ප්‍රවාහන කටයුතු වලදී සෑම වර්ෂයකම අවසාන කාර්තුවට අදාල වියදම ඊළඟ වර්ෂයේ ඉදිරිපත් වීමත්, විදේශීය විනමය අනුපාතයේ අහිතකර විචලතාවය නිසා අපේක්ෂිත වියදමට වඩා වියදම් දැරීමට සිදුවීමත් නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පොලිසැක් මලු මිලදී ගැනිම සඳහා ලංසු කැඳවීමේදී එක් පෞද්ගලික ආයතනයක් විසින් Lot 1 හා 2 සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබුණ ද, එක් කොටසක් සඳහා පමණක් ප්‍රමාණවත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කර තිබුණි. ප්‍රමාණවත් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් නොකිරීම, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 (ආ) වගන්තිය අනුව විශාල බැහැරවීමක් සේ නොසලකා තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම ලංසු සුරක්ෂණය Lot2 සඳහා ඉදිරිපත් කළ සේ සලකා සුදු පැහැති මලු 75,000 ක් මෙම ආයතනයෙන් රු.4,132,410 කට මිලදී ගෙන තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4(ආ) වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | Lot1 (රතු පැහැති) හා Lot2 (සුදු පැහැති) සඳහා වෙන වෙනම ලංසු සුරක්ෂණ ඉදිරිපත් කළයුතු වුවද DSS Polysacks(Pvt)Ltd ආයතනය එක් ලංසු සුරක්ෂණයක් පමණක් ඉදිරිපත් කර තිබුණි. එහිදී Lot2 (සුදු පැහැති) පොලිසැක් මළු සඳහා අවම මිල DSS Polysacks වෙතින් ඉදිරිපත් වී ඇති හෙයින් ඉදිරිපත් කළ එකම ලංසු සුරක්ෂිතය ඒ සඳහා යොදාගෙන ඇත. |
| (ආ) | මධ්‍යම තැපැල් හුවමාරුවේ ස්කෑන් යන්ත්‍ර ස්ථාපිත කිරීම සඳහා ගොඩනැගිල්ල ඉදිකිරීම:<br>(i) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 (ආ) ඡේදය ප්‍රකාරව ලංසු ඉදිරිපත් කළ එකම තැනැත්තා විසින් සඳහන් කර ඇති මිල ගණන් අධික වන විට ඒවායේ මිල අඩුකිරීමට ලංසුකරු සමඟ සාකච්ඡා කළ යුතු විය. එහෙත් එපරදි කටයුතු නොකර ප්‍රමාණපත්‍රවලසමහර අයිතමයන් සඳහා අධික මිලක් සහිතව වලංගු | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.12.2 (ආ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | මෙම ප්‍රසම්පාදනය සඳහා සුදුසුකම්ලත් එකම ලංසුකරු ජයතුංග කන්ස්ට්‍රක්ෂන් බැවින් ඔහුගේ ලංසු මිල ඇස්තමේන්තු මිලට වඩා අඩු බැවින් එක් එක් මිල ගණන් පිළිබඳ විශ්ලේෂණය කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | ලංසුව ඉදිරිපත් කළ එකම ලංසුකරුට රු.මිලියන 5.09 කට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. | | |
| (ii) | නියමිත දිනට වැඩ අවසන් කිරීමට නොහැකි වූයෙන් කොන්ත්‍රාත්කරුවන් සඳහා වූ උපදෙස් පත්‍රයේ (ITB) 6.4 ඡේදය ප්‍රකාරව ප්‍රමාද වූ දින 42 ක් සඳහා රු.560,709 ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | උපදෙස් පත්‍රයේ 6.4 කරුණ ප්‍රකාර කටයුතු කළ යුතු වීම. | අදාල ප්‍රමාද ගාස්තුව වූ රු.560,709 ක මුදල ඉහත කී කොන්ත්‍රාත්කරුට ලබාදී ඇති අනෙක් කොන්ත්‍රාත්තුව වන නාරාහේන්පිට ඉංජිනේරු අංශය අලුත්වැඩියා කිරීම සඳහා වූ ගෙවීම්වලින් ඔහුගේ එකඟතාවය මත අඩුකර ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ඇ) | තැපැල් දෙපාර්තමේන්තුවේ මධ්‍යම තැපැල් හුවමාරුව සඳහා එක්ස්රේ ස්කෑනර් යන්ත්‍ර 03 ක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සමාගමක් වෙත යන්ත්‍ර 02 ක් රු.මිලියන 25.42 කට හා එකක් රු.මිලියන 13.78 කට වශයෙන් එකතුව රු.මිලියන 39.21 කට මිලදී ගැනීම සඳහා 2017 නොවැම්බර් 22 දින ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ. | | |
| (i) | මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීමට 2016 අගෝස්තු 23 දින තැපැල්පතිවිසින් ප්‍රසම්පාදන ගණකාධිකාරී වෙත උපදෙස් ලබා දී තිබුණද, ප්‍රසම්පාදනය පිරිනමා තිබුණේ 2017 නොවැම්බර් 22 දිනදීය. ප්‍රසම්පාදනය නිමකිරීම 2018 ජූලි මාසයේදී සිදුකර තිබුණු අතර මේ සඳහා වසර 02 කට ආසන්න | සැලසුම්සහගතව ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු වීම. | 2016 සැප්තැම්බර් 09 දින එක්ස්රේ යන්ත්‍ර මිලදී ගැනීමට යෝජනා වූ අතර 2017 නොවැම්බර් 22 දින වන විට මෙම කොන්ත්‍රාත්තුව Excel Lanka International (Pvt) Company වෙත පිරිනමන ලදී. ඒ අනුව මෙම ප්‍රසම්පාදනයට වසරකට ආසන්න කාලයක් ගත වී ඇත. තවද ඇගයීම් කමිටුව සඳහා තාක්ෂණික නිලධාරියකු ලෙස සහභාගී කර තිබුණේ මේ පිළිබඳ විශේෂඥ දැනුම සහිත යුධ හමුදා මේජර්වරයෙකුය. ඔහුගේ අධික රාජකාරී ස්වභාවය හේතුවෙන් මෙම |

| | | | |
|---|---|---|---|
| | කාලයක් ගතකර තිබුණු බව නිරීක්ෂණය විය. | | කාලය තුළ රාජකාරී අවශ්‍යතාවයක් සඳහා වරින් වර විදේශ ගතවීම නිසා තාක්ෂණික ඇගයීම් කමිටු රැස්වීම් සඳහා දින යොදා ගැනීමට ගැටලු සහිත විය. ප්‍රමාදයට මෙම තත්ත්වය හේතු විය. |
| (ii) | උක්ත යන්ත්‍ර 03 න් 02 ක් ලැබී මාස 11 ක් හා අනෙක් යන්ත්‍රය ලැබී මාස 06 ක් ඉක්ම ගොස් තිබුණද 2019 ජනවාරි වන විටත් එම යන්ත්‍ර උපයෝජිත තත්ත්වයේ පැවතිණි. | මෙම යන්ත්‍ර 03 උපරිම උපයෝජිත තත්ත්වයෙන් පවත්වා ගැනීමට කටයුතු සිදුකළ යුතුවීම. | මේ වන විට යන්ත්‍ර 03 ම උපරිම ක්‍රියාකාරීත්වයේ පවතී. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**විගණන නිරීක්ෂණය**

**-------------------------**

(අ ආයතනසංග්‍රහයේviii වන පරිච්ඡේදයේ 3.2 වගන්තිය ප්‍රකාර අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන්
ඒකාන්තයෙන් පරිබාහිර වූද, හදිසි වූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකි වැඩ සඳහා පමණක් වු
අතිකාල ගෙවීම සිදුකර තිබුණි

(ආ) ආයතන සංග්‍රහයේ viii
වගන්තියප්‍රකාරවයම්කිසිදෙපාර්තමේන්තුවකනිතිපතාඅතිකාලවැඩපවතිනඅවස්ථාවකදීපරිවර්තිතඅතිකාලදීමනාව
කළ යුතු වුවද මෙම වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ආයතන සංග්‍රහයේ viii පර්ච්ඡේදයේ7.1 සහ 7.2 වගන්තිප්‍
ඉක්මවනඅතිකාලසඳහාඅමාත්‍යාංශලේකම්ගේඅනුමැතියලබාගතයුතුවුවදඑසේඅනුමැතියලබාගැනීමෙන්තොරව,
තිබුණි.2018 දෙසැම්බර් මාසයේදී සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව මධ්‍යම තැපැල් හුවමාරුවේ සේවකයින් 150
වියදම රු.මිලියන 40.32 ක් විය.

(ඈ) 2017 අප්‍රේල් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක්ම පැමිණී
භාවිතා කළ යුතු බවට දක්වා තිබුණද මධ්‍යම තැපැල් හුවමාරුවේ මෙම යන්ත්‍ර සවිකර නොතිබුණි.

(ඉ) 2012 ජූනි 21 දිනසිටක්‍රියාත්මකවනපරිදිරාජ්‍යසේවාකොමිෂන්සභාවවිසින්අනුමතකරනලදනවබඳවා ගැනීමේ
තැපැල් සේවයේ I වන ශ්‍රේණියට උසස් කිරීමට අවශ්‍ය සියළු සුදුසුකම් සපුරා නොමැති තැපැල් සේවා නිලධාරි
බඳවා ගැනීම් පරිපාටියේ 10.2.1 හි සඳහන් අවශ්‍යතා සම්පූර්ණ නොකරන ලද නිලධාරීන් 668 දෙනෙක් සඳහා I

(ඊ) ඉහත කරුණ සම්බන්ධයෙන්තැපැල්දෙපාර්තමේන්තුවහාරාජ්‍යසේවාකොමිෂන්සභාවඅතරවිවිධඅවස්ථාවලදීඅ
අගෝස්තු 17 දින රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී කොමිෂන් සභා ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු
නියෝජිතයන් සහ තැපැල් අමාත්‍යාංශ නියෝජිතයන් දසමග පවත්වා තිබූ රැස්වීමේදී, රාජ්‍ය සේවා කොමිෂන්
ලෙස දක්වා ඇතිනිර්දේශය සංශෝධනය කළ යුතු නම් එය ලිඛිතව තැපැල්පති විසින් රාජ්‍ය සේවා කොමිෂන
එපරිදි කටයුතු කර නොතිබුණි.

(උ) 2018 දෙසැම්බර් 31 දිනට අයකර නොගත් ස්ථාන මාරු වී ගිය, මියගිය, විශ්‍රාමික, වැඩ තහනම්කළ, සේවය
එකතුව රු.මිලියන47.92 ක් විය. මින් වසර 5 කට අධික කාලයක සිට පවතින ණය ශේෂවල වටිනාකම රු.මිලි
52 ක් ද විය. තවද වැඩ තහනම් කළ හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.මිලියන 23.87 ක් සම්බ
වගන්තිය ප්‍රකාරව ඇපකරුගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වසර 06 ක කාලයක සිට රු.මිලියන 1.29 ක මූල්‍ය වංචාවකට අදාලව හිඟ
වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.** **තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම**

**--------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයන් විසින්ම කටයුතු කළ යුතුව පැවති අතර තැපැල් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් අරමුණු 17 ක් සම්බන්ධයෙන් තොරතුරු පසුගිය වසරේදී ඉදිරිපත් කර තිබුණි. මෙම අරමුණුවලින් Bepostව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රමුඛස්ථානය දෙන බව දන්වා තිබුණද එම ව්‍යාපෘතියේ තිරසර සංවර්ධන ඉලක්කයන්හි ලඟාවීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකර ගැනීමට කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය නොවීය. එබැවින් සමාලෝචිත වර්ෂයේ ලඟාකර ගත් ඉලක්ක ගත ප්‍රමාණය පිළිබඳ පරීක්ෂා කිරීමට නොහැකි විය. | තිරසර සංවර්ධන ඉලක්ක මැන බැලීමට පැහැදිලි නම්‍යශීලී දත්ත පදනමක් හඳුනා ගත යුතු වීම. | b-post ඉ ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්ක හා දර්ශක හඳුන්වා දී ඇති අතර මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 200 ක් පමණ ලියාපදිංචි වී ඇත. තවද 2019 – 2023 වර්ෂ තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති පස් අවුරුදු සැලැස්මට ඇතුලත් කර ඇත. 2019 වර්ෂයේ ඇස්තමේන්තුවට මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 9 ක ප්‍රතිපාදන ඉල්ලා සිටි නමුත් එය නොලැබීම මත ඉදිරි කටයුතු කළ නොහැකි විය. 2020 වර්ෂය සඳහාද මේ සඳහා ප්‍රතිපාදන ඉල්ලුම්කර ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේනිලධාරීගේඅදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදෙසැම්බර් 31 දිනට තැපැල් දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 1,182 ක් වූ අතර 2015 වර්ෂයට පෙර සිට තනතුරු වර්ග 9 ක් දිගින් දිගටම පුරප්පාඩුව පැවතිණි. | පුරප්පාඩු සංඛ්‍යාව ප්‍රමාදයකින් තොරව පිරවීමට කටයුතු කළ යුතු වීම හා අනවශ්‍ය තනතුරු වේ නම් සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුවීම. | උසස්වීම් හා බඳවා ගැනීම් සිදු කෙරෙමින් පවතී. |